# God King ශ්‍රී ලාංකේය නව නළු රස ඔස්ට්‍රේලියාවට ඉංග්‍රීසියෙන්



මැයි 21, 22 සහ 23 දින වලදී මෙල්බර්න් වේදිකාවේ දිග හැරෙන අපේ ඉංග්‍රීසි නාට්‍යය තරංග දන්දෙණියගේ God King Drama

*තරංග දන්දෙණිය තරුණ නාට්‍යවේදියාගේ රාසිං දෙවියෝ වේදිකා නාට්‍යය ගෝඩ් කි නමින් ඉඩග්‍රීසි භාෂාවෙන් වේදිකා ගත කරන්නට සූදානම් වෙමින් සිටියදී ඔහු ඒ පිළිබඳව සන්නසට අදහස් දැක්වූයේ මෙසේය*

**The God King Drama කියන්නේ මොන වගේ නාට්‍යය-ක්ද?**



මෙම නාට්‍ය ඉංග්‍රීසි භාෂාවෙන් රඟදක්වන අපේ කතා පුවතක් තරංග දන්දෙණියගේ (මගේ) රාසින් දෙයියෝ වේදිකා නාට්‍යයේ අනුවර්තනයක් විදිහට හඳුන්වන්න පුලුවන්. මෙම නාට්‍යයේ අනුවර්තනයට හේතුවන්නේ Monash විශ්වවිද්‍යාලයේ දැනට සිදුකරන රංග කලාව පිළිබඳ ආචාර්ය උපාධියේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පරීක්‍ෂණයේ එක් අවස්ථාවක්.

මෙහිදී පර්යේෂනයට බඳුන් වන්නේ සමාජ/ ආර්ථික/ දේශපාලන වශයෙන් බල රහිත හෝ සහ වෙනත් ජාතීන් බලවත් වූ සංස්කෘතික අවකාශයකදී අල්ප වශයෙන් අවධා-නයට ලක්වූ ජාතියක් එම තෙවන සංස්කෘතික අවකාශයේ සිව්වන බහු සංස් කෘතික ප්‍රේක්ෂාගාරයට තම සංස්කෘතික අවශ්‍යතාව වේදිකා ගත කරන්නේ කෙසේද යන්නයි.

සංස්කෘතික අනන්‍යතාවය කියනනේ බහුමානී දෙයක් එකක් අපි පෙන්වන උත්සාහය කරන අනන්‍යතාව උදාහරණයක් හැටියට ජන ගැලුම් ආදී ශිල්ප සම්ප්‍රදායික චාරිත්‍ර විධි ආදිය ඒ වගේම වෙනත් කෙනෙක් අපි දිහා බලන විදිහ වෙන ආකාරයක් විය හැකිය එහිදී ශ්‍රී ලාංකිකයන් යුද්ධ හා සබැඳුනු චර්යා රටා මාගේ අයිතිවාසිකම් ප්‍රශ්න බෝට්ටු ජනතාව, රන් කියන රට, ක්‍රිකට් ගහන ලංකාව ආදී ඒ අයට වඩාත් ආවරණය වූ දේ හරහා ආකල්ප ගොඩනගාගන්න පුලුවන් මේ අතරේ අපේ සංස්කෘතික අනන්‍යතාව මේ සියල්ල හෝ මේ දේත් අඩංගු වන දෙයක් වන්නට පුලුවන් කෙසේ වෙතත් කාලයක් පුරා රටක ජනතාව භාවිතා කරන ප්‍රකාශන රටාව සංඥා, සංකේත තවත් ජාතියක් සමග සංනිවේදනයේදී ගැටළුවක් හෝ වෙනත් අර්ථ ගැන්වීමට ලක්වීමට ඉඩ හසර වැඩියි The God King Drama හි මේ තත්වයන් සලකා බලනවා .



මෙම නාට්‍යයේ පූර්ව රංගය සහ අපර රංගය සකස් වෙන්නේ යුද්ධයේ අවසන් අධියරයේ සිටින රටක පොදු ජන උත්සාහය වෙනුවෙන් පාලකයා සහභාගිවන සැනකෙළියක අවස්ථාවලින් ප්‍රධාන කොටස හෙවත් වෙදිකා නාට්‍ය දෙවන රාජසිංහ රජ දවස යුද්ධයට බලයෙන් යැවූ ජන නැටුම් කරුවන් දෙදනෙක් වටා ගොඩ නැගෙනවා යුද්ධායෙන් පලා විත් එහෙත් මියගියායැයි සලකන මේ දෙදනාගේ ජීවත් වීමට කරන අරගලය පොදු ජනයා අවිශ්වාස කරමින් වෙස්වලාගෙන ජනතාව අතර සැරිසරන රජු තම පවත්වා ගැනීම උදෙසා කරන බල අරගලයත් මෙම නාට්‍යයෙන් කියවෙන කතාපුවත වේ.

මෙම නාට්‍ය කෙතාලම් සහ අනෙක් ජන රංගනයේ ආභාෂය ලබා තිබෙනවා ලෝක ධර්ම සහ නාට්‍ය ධර්ම රංග යන්හි මිශ්‍රනයක් වන The God King Drama වෙස් මුහුනු ජන නැටුම්, ජන සංගීතය මූලාශ කරගනු ලබනවා. ඉංග්‍රීසි භාෂාවේ සංවාද සමඟ ඇතැම් ගීත සිංහල භාෂා-වෙන් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබනවා ශ්‍රී ලාංකීය ශරීර සහ අර්ථ ගැනිම මෙම පර්යේෂණයේ එක් තෝරා ගැනීමක්.

ප්‍රවීණ රංගධරයෙක් සහ නිර්මාණ වේදීන් රැසක් මෙම නාට්‍ය ඉදිරිපත් කිරීමේදි දායක වෙනවා. නාට්‍යයේ සංගීතය මේ වන විට ප්‍රවීන සංගීතවේදී ඩී.ඩී. ගුණසේනයන්

The God King Drama ඉදිරිපත් කරන්නේ Monash Academy of Performing Arts centre for theatre performance, සහ Sri Lankan Theatre Association හි එකමුතුවෙනි.

## බෝසත් හදවත්

මුදල් අඟහිඟ කම නිසා සරසවියට පියමනින්නට නොහැකිව ඔබේ සහය ඉල්ලා සිටි ගලේවෙල බඹරගස්වැව සමුද්‍රිකා දියණියට අත දෙන්නට සන්නස පාඨකයන් රැසක් ඉදිරිපත්වීම අපේ සතුටට කාරණයකි.

ඇයට සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා පරිගණකයක අවශ්‍යතාවද අපි මතු කළෙමු. වික්ටෝරියාවේ කීල ඩවුන්ස්හි කාංචනා හා දීපාල් ගුණවර්ධන යුවල සමුද්‍රිකාට ලබාදීම සඳහා පරිගණකයක් සන්නස කාර්යාලයට පසුගියදා බාර දුන් බව සතුටින් දන්වමු.

මේ පරිගණකය ශ්‍රී ලංකාවට යැවීම සඳහා අනුග්‍රහය දක්වන්නට ට්‍රාන්ස්කෝ කාගෝ ආයතනය ඉදිරිපත් වූ බවද කෘතවේදීව දන්වමු.

අපේ ලෝකය සුන්දර තැනක් බවට පත් කරන්නේ පරාර්ථකාමීත්වයෙන් පිරි ඔබ වැනි සුන්දර මිනිසුන් ය.

නාට්‍යය මැයි මස 21,22 සහ 23 දින ප.ව 6.45 ට Mohash University Clayton Campus ys Performing Art Center (Building 68) හි රඟක්වනවා. වෙලාවට පැමිණීම අත්‍යාවශ්‍යයි සීමිත. ආසන බැවින් වෙන් කරවා ගැනීම සිදුකල හොත් අපහසුවක් ඇතිවන එකක් නෑ.

විමසීම් තරංග - 0433707241
Tharanga.Dandeniya@monash.edn

